# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/36 – 2020 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා – 2020.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/04.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හැලමඩ, හපුගස්තැන්න, දෙල්ගහමුලවත්ත හි පදිංචි එන්. යූ. ඩී. රණසිංහ මයා, ගම්පහ, නාරංවල, අංක 234/2 හි පදිංචි කේ. කේ. අජිත් සිසිර මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.03.11 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූලි මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

### කොළඹ කාර්මික අධිකරණය

බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දී ය.

(1) එන්. යූ. ඩී. රණසිංහ
දෙල්ගහමුල වත්ත,
හපුගස්තැන්න,
හැලමඩ.

1A – G32672 – 27 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) කේ. කේ. අජිත් සිසිර
අංක 234/2, නාරංවල,
ගම්පහ.

*පළමු පාර්ශවය*

IR/COM/04/2017/04.

සහ

නඩු අංකය : A/39/2019

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

දෙවන පාර්ශවය

අතර පවත්නා කාර්මික ආරවුල

*පෙනී සිටීම -*

| | | |
|---|---|---|
| පළමු පාර්ශවය වෙනුවෙන් | - | නියෝජිත එච්. ඒ. ජී. මයිකල් මහතා |
| දෙවන පාර්ශවය වෙනුවෙන් | - | නීති නිලධාරිණී දිමුතු පනංගල මහත්මිය |
| | | රජයේ නීතිඥ මල්මී අබේසුන්දර මෙනෙවිය |

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 38 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ:

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මට්ටක්කුලිය ඩිපෝවේ මෝටර් කාරමිකයන් ලෙස සේවය කරන එන්. යූ. ඩී. රණසිංහ මයාට සහ කේ. කේ. අජිත් සිසිර මයාට 2012.09.30 දින රාත්‍රියේ දී ආයතනයේ සිදුවූ සොරකමක් සම්බන්ධයෙන් එයට අනුබල දුන්නේ යැයි චෝදනා කරමින් ලබා දී ඇති දඬුවම් සාධාරණ වන්නේ ද? එසේ නොවන්නේ නම්, ඔවුන්ට ලැබිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

දෙපාර්ශවය විසින් සිය පළමු ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව ප්‍රථම වරට මෙම නඩුව විභාග කිරීම සඳහා කැඳවූ ප්‍රථම දිනයේ දී දෙවැනි පාර්ශවය තම දෙවැනි ප්‍රකාශය ගොනු කරන ලද අතර ඊට ප්‍රති පිළිතුරු සැපයීම සඳහා පළමු පාර්ශවය දින ඉල්ලා සිටින ලදී. බේරුම්කරණය විසින් කරුණු දක්වමින් පවසා සිටියේ යම් සමථයක් ඇත්නම් බේරුම්කරණයට ද පිටපතක් සහිතව සමථ යෝජනාව ඉදිරිපත් කරන ලෙසත්, ඊළඟ දිනයේ දී සමථයක් ඇත්නම් ඒ පිළිබඳව මෙම බේරුම්කරණය වෙත දැනුම් දෙන ලෙසටත් සමථයක් නොවේනම් විභාගය සඳහා සූදානම්ව පැමිණෙන ලෙසත් දන්වා සිටින ලදී. ඒ අනුව පළමු පාර්ශවය විසින් තම සමථ යෝජනාවේ පිටපතක් ගරු බේරුම්කරණය වෙත යොමු කර ඇත. තවද, තම ප්‍රති පිළිතුරු ද පළමු පාර්ශවය විසින් මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇත.

ඉන් අනතුරුව 2019.08.19 වැනි දින මෙම බේරුම්කරණ නඩුව කැඳවූ අවස්ථාවේ දී සමථ යෝජනාව තමන් වෙත නොලැබුණු බව නීති නිලධාරිණී දිමුතු පනංගල මහත්මිය ගරු බේරුම්කරණය වෙත දැනුම් දුන් අතර ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපියක් කෙසේ නොලැබී තිබේන්නේ ද යන්න ගැටළුවක් බව පළමු පාර්ශවයෙන් ප්‍රකාශ කරන ලදී. කෙසේ වුවද දෙවැනි පාර්ශවය වෙත අදාළ සමථ යෝජනාවෙහි පිටපතක් ලබා දෙන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට එය ඉදිරිපත් කළ හැකි බව ඇය විසින් දන්වා සිටින ලදී.

කෙසේ වෙතත් අද දින මෙම නඩුව ආරම්භ කරන ලෙසට පළමු පාර්ශවයට නියෝග කිරීමෙන් අනතුරුව පළමු පාර්ශවය විසින් ඉල්ලුම්කරුවන් අතරින් නෙළුම්දෙනියගේ උපාලි ධර්මප්‍රිය මහතා සාක්ෂියට කැඳවන ලදී. මෙහිදී සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් තමන් මෙම රිම් වළළු සොරකම සිදු වූවා යැයි කියන දිනයේ සිය රාජකාරි කටයුතු පිළිබඳව කරුණු දක්වමින්, මෙම ටයර් සහ රිම් වළලු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම පවතින්නේ ඉංජිනේරුවරයා වෙත බවත් ආරක්ෂක අංශය විසින් ඒවා ආරක්ෂා කිරීමේ කටයුතු සිදුකළ

යුතු බවත් සාක්ෂි ලබාදෙන ලදී. තවද, මෙම හොරකමට සම්බන්ධ පුද්ගලයකුද පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර සොරකම් කරන ලද රිම් වළලු නැවත ආයතනය වෙත අධිකරණය මගින් ලබාදී ඇති බවත්, සොරකම්කරන ලද පුද්ගලයාට දඬුවම් පමණුවන ලද බවත් සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. තවද, තමන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා දඬුවම් නියම කළ බවත්, අභියාචනය කිරීමෙන් අනතුරුව දඬුවම් ලිහිල් කළ බවත් සාක්ෂි දෙමින් පවසා සිටින ලදී.

නැවත විභාගය සඳහා මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී දෙවැනි පාර්ශවය විසින් පළමු පාර්ශවය ගෙන එන ලද සමථ යෝජනාව පිළිබඳ සිය ස්ථාවරය දක්වා සිටිමින් පවසා සිටියේ අභියාචන නියෝගයේ දෙවැනි දඬුවම පමණක් ඉවත් කිරීමට සමථ කමිටුව එකඟ වූ බවත් අත්හිටවන ලද මසක වැටුප ගෙවීමට එකඟතාවයක් නැති බවත් දන්වා සිටින ලද අතර පළමු පාර්ශවය තම ස්ථාවරය දක්වා සිටිමින් පවසා සිටියේ සම්පූර්ණයෙන්ම අභියාචනා නියෝගය අවලංගු කරන්නේ නම් පමණක් මෙම සමථයට කැමති බවත් එසේ නොමැතිව දඬුවමින් කොටසක් ඉවත් කිරීම සම්බන්ධයෙන් තමන් එකඟ නොවන බවත් ය. ඒ අනුව මෙම නඩුව විභාග කොට ප්‍රදානයක් ලබා දීම සුදුසු බැවින් තවදුරටත් සාක්ෂි විමසීම ආරම්භ කරන ලදී.

පළමු පාර්ශවයේ පළමු සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමෙන් අනතුරුව දෙවැනි ඉල්ලුම්කරු ද සාක්ෂි ලබා දී එම සාක්ෂි දෙවැනි පාර්ශවයේ හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව මට්ටක්කුලිය ඩිපෝවේ සහකාර ඉංජිනේරු තැනගේ සාක්ෂිය ලබා ගැනීමෙන් අනතුරුව එය ද හරස් ප්‍රශ්න විමසීමට භාජනය කරන ලදී. මෙසේ සාක්ෂි විමසීම සිදුකරමින් සිටි අවස්ථාවේ 2020.01.06 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී දෙවැනි පාර්ශවයේ රජයේ නීතිඥවරිය කරුණු දක්වමින් දැනට නව කළමනාකාරිත්වයක් සිටින බැවින් එම කළමනාකාරිත්වයට සමථ යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට අපේක්ෂිත බැවින් ඒ සඳහා දින ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදුව ඒ සඳහා අවස්ථාව ලබා දෙමින් විභාගය කල් තබන ලදී. ඒ අනුව නැවත මෙම පරීක්ෂණය පැවැත්වීම සඳහා මෙකී බේරුම්කරණ නඩුව කැඳවූ 2020.02.06 දින දෙවැනි පාර්ශවය විසින් කරුණු දක්වමින් කියා සිටියේ මෙම ආරවුල සමථය කර ගැනීමට දෙවැනි පාර්ශවය සූදානම් බවත් අභියාචන නියෝගය මත පනවා ඇති දඬුවම් දෙකම ඉවත්කර ගැනීමට තමන් එකඟ බවත් පවසා සිටින ලදී. ඒ පිළිබඳව කරුණු දක්වමින් පළමු පාර්ශවයේ නියෝජිත මහතා පවසා සිටියේ මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන්ට එරෙහිව පනවා ඇති අභියාචන නියෝග සම්පූර්ණයෙන්ම ඉවත්කිරීමට දෙවැනි පාර්ශවය එකඟ වී ඇති බැවින් තමන් මෙම සමථ යෝජනාවට එකඟ බවත් ඒ අනුව කටයුතු කිරීමට සූදානම් බවත් ය.

ඒ අනුව මෙම සමථය පරිදි කටයුතු කිරීමට හැකිවන පරිදි මෙම බේරුම්කරණ නඩුව 2020.03.03 දිනට කල් තැබූ අතර ඒ අනුව සමථය පරිදි මෙම ඉල්ලුම්කරුවන්ට ගෙවීමට ඇති මසක වැටුප හා අභියාචනා නියෝගය ඉවත්කළ බවට වන ලිපි එදිනට අධිකරණයේ දී මෙම ඉල්ලුම්කරුවන් වෙත ලබා දී මෙම ආරවුල සමථයකට පත්කර ගන්නා ලෙසට දැනුම් දෙන ලදී.

### ප්‍රදානය

මෙම බේරුම්කරණ නඩුවට අදාළව දෙවැනි පාර්ශවය විසින් ගෙන එන ලද සමථ යෝජනාවට අනුව අද දින කේ. කේ. අජිත් සිසිර මහතාගේ සේවය අත්හිටුවා තිබූ 2016.04.22 සිට 2016.05.21 දින දක්වා වූ මසක වැටුප වන රුපියල් තිස්නවදහස් හාරසිය තිස් හය (රු. 39,436/-) ක මුදල සහ අනික් ඉල්ලුම්කාරයා වන එන්. යූ. ඩී. රණසිංහ මහතාගේ සේවය අත්හිටුවා තිබූ 2016.04.22 දින සිට 2016.05.21 දින දක්වා වූ නොගෙවා තිබූ මසක වැටුප වූ රුපියල් තිස් අටදහස් අටසිය හැට හතර (රු. 38,864/-) ක මුදල අද දින විවෘත අධිකරණයේ දී එකී පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් වෙත අද දින ගෙවන ලෙසට නියම කරමි.

එමෙන්ම මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනාට එරෙහිව අභියාචනා නියෝගය පරිදි නිකුත් කරන ලද දඬුවම් ලිපිය අවලංගු කිරීමේ ලිපි දෙක වෙන වෙනම ඉල්ලුම්කරුවන් දෙදෙනාට භාර දෙන ලෙසට නියම කරමි.

ඒ අනුව මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනාට ගෙවීමට නියමිතව තිබූ මුදල් නිසි පරිදි අද දින විවෘත අධිකරණයේ දී ගෙවා අවසන් කරන ලද අතර, ඔවුන්ගේ දඬුවම් ඉවත් කිරීමේ ලිපි ද එම දෙදෙනා වෙත භාර දීමෙන් මෙම ආරවුල සමථය කර ගැනීමට කටයුතු කරන ලදී.

එමෙන්ම මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ නියමිත මාසික වැටුපට අදාළ සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ඊළඟ මස වැටුප සමගම ගෙවීමට ද එකඟ වන බව දෙවැනි පාර්ශවය තම එකඟතාවය පළ කර ඇති බැවින් තවදුරටත් ආරවුලක් දෙපාර්ශවය අතර නොපවත්නා බැවින් මෙම සමථ නියෝගය ප්‍රදානයක් ලෙස ප්‍රකාශ කර සිටිමි.

මෙම සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2020 මාර්තු මස 11 වැනි දින.

08 - 611

මගේ අංකය: IR/COM/02/2017/07.

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් දෙහිඕවිට, අල්ගොඩ, දූහැම් සෙවන, අංක A58 - 2 හි පදිංචි ඩබ්. ජයන්ත වීරසිරි මයා සහ කැළණිය, දළුගම හි පිහිටි කැළණිය විශ්ව විද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.03.11 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජූලි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## කොළඹ කාර්මික අධිකරණයේදී ය.

ඩබ්. ජයන්ත වීරසිරි මයා,
නො. A58 -2,
දූහැම් සෙවන,
අල්ගොඩ,
දෙහිඕවිට.

යොමු අංකය: IR/COM/02/2017/07 (පළමු පාර්ශවය)

නඩු අංකය: A/37/2019 සහ

කැළණිය විශ්ව විද්‍යාලය,
දළුගම,
කැළණිය

(දෙවන පාර්ශවය)

අතර පවත්නා කාර්මික ආරාවුල

## ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.03.26 දින නො. 242, ශ්‍රී සෝභිත මාවත, නාගොඩ, කළුතර හි පදිංචි ඕබඩගේ ලීලාරත්න වන මා පත්කොට මා වෙත යොමුකොට ඇත.

එකී කාර්මික ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

''කැලණිය විශ්වවිද්‍යාලයේ කම්කරු (III ශ්‍රේණිය) තනතුරක සේවය කරන ලද ඩබ්. ජයන්ත වීරසිරි මයාගේ සේවය 2014.05.19 දිනැතිව අවසන් කිරීම අසාධාරණ හා අයුක්ති සහගත වන්නේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද'' යන්න පිළිබඳව වේ.

මෙකී ආරාවුල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් පළමු හා දෙවන පාර්ශවයන් විසින් සිය පළමු ප්‍රකාශය සහ දෙවන පාර්ශවය විසින් පමණක් සිය දෙවන ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු තම පළමු ප්‍රකාශයෙන් පවසා ඇත්තේ තමන්ට අසාධාරණ ලෙස නිවාඩු දමා තමා වැටුප් රහිත නිවාඩු යැවීමෙන් පසුව අත්තනෝමතික ලෙස තම සේවය අවසන් කල බවයි. මෙහිදී ඔහු වැඩිදුරටත් පවසා සිටින්නේ තමා වැඩ කරන දිනයේ නියමිත වේලාවට වඩා වැඩියෙන් සේවය කල පැය ගණන සලකා බලා

එම කාලය නිවාඩු සඳහා හිලව් කර නොමැති බවයි. පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු විසින් නිවාඩු ලබාගෙන ඇති දිනයන් සම්බන්ධයෙන් විවිධ හේතු ඉදිරිපත් කරමින් ඒ වෙනුවෙන් තමන්ට නිවාඩු අනුමත නොකිරීමෙන් අසාධාරණයක් සිදුවූ බව පවසා ඇත. එහෙත් මෙම ප්‍රකාශය පුරාම තමා වැටුප් රහිත නිවාඩු නොගත් බවට තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකර තිබීම ද මෙම ප්‍රදානය ලබාදීමේදී සැළකිල්ලට ගතිමි.

දෙවන පාර්ශවය වන කැළණිය විශ්වවිද්‍යාලය විසින් සිය ප්‍රකාශවල මෙම පළමු පාර්ශවයේ සේවකයා නිවාඩු ලබාගත් ආකාරය පිළිබඳව පැහැදිලි තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, ඉල්ලුම්කරු විසින් තමන්ට නිවාඩු ලබා නොදුන්නේ යැයි ඉදිරිපත් කර ඇති කරුණු නිවාඩු ලබාදීම සම්බන්ධයෙන් අදාල නීති රෙගුලාසි තුළ නොමැති බැවින් එසේ නිවාඩු ලබාදීමට හැකියාවක් නොමැති බවද, මෙම ඉල්ලුම්කාර සේවකයා සිය පරිවාස කාලය තුල වැටුප් රහිත නිවාඩු යාම හේතුකොටගෙන මොහුගේ සේවය ස්ථිර නොකර තවදුරටත් වසරකින් පරිවාස කාලය දීර්ඝ කළ බවද, එසේ පරිවාස කාලය දීර්ඝ කරමින් ඉදිරියට නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් සැලකිලිමත්ව වැටුප් රහිත නිවාඩු ලබාගැනීමෙන් වලකින ලෙසට අවවාද කර ඇතත්, ඒ ලිපිය ද නොසලකා හරිමින් දීර්ඝ කරන ලද පරිවාස කාලය තුළදී ද වැටුප් රහිත නිවාඩු 04 ක් ලබාගෙන ඇත. මෙසේ පරිවාස කාලය තුළදී වැටුප් රහිත නිවාඩු ලබාගැනීම හා ලබාදෙන ලද උපදෙස් ද නොසළකා හරිමින් දීර්ඝ කරන ලද පරිවාස කාලය තුළදී ද, වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බැවින් මෙම ඉල්ලුම්කාර සේවකයාගේ සේවය අවසන් කරන ලද බවට කරුණු දක්වා ඇත.

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු සැළකිල්ලට ගැනීමෙන් අනතුරුව දෙපාර්ශවයම පරීක්ෂණය සඳහා 2019.08.02 දින කාර්මික අධිකරණය වෙත කැඳවීමක් කලද ඉල්ලුම්කාර සේවකයා එදින කිසිදු දැනුම් දීමකින් තොරව පරීක්ෂණය සඳහා පැමිණියේ නැත. ඒ අනුව නැවත වරක් 2019.08.29 වන දින දෙපාර්ශවය පරීක්ෂණය සඳහා කැඳවනු ලදුව දෙපාර්ශවයම පැමිණ සිටියද, එදින පළමු පාර්ශවය වෙනුවෙන් නීතිඥ මහතකු හෝ නියෝජිත මහතකු පෙනී නොසිටි තත්ත්වය යටතේ නීතිඥ මහතකු ඉදිරිපත් කිරීම සඳහා දිනයක් ඉල්ලීම මත 2019.09.06 දිනට පරීක්ෂණය කල් තබන ලදී. එහෙත් නියම කරන ලද දිනයේදී ද ඉල්ලුම්කරු නොපැමිණීමේ හේතුව මත දෙවන පාර්ශවය විසින් ඉල්ලුම්කරුගේ නොපැමිණීම මත මෙම නඩුව නිශ්ප්‍රභා කරන ලෙසට ඉල්ලා සිටියද, ඉල්ලුම්කාර පාර්ශවයට නැවතත් අවස්ථාවක් ලබාදෙමින් අවසාන වශයෙන් 2019.09.24 දිනට දෙපාර්ශවය පරීක්ෂණය සඳහා කැඳවන ලදී.

නියමිත දින දෙපාර්ශවයම පරීක්ෂණය සඳහා පැමිණ සිටි අතර, ඉල්ලුම්කාර පාර්ශවයට තම නඩුව ආරම්භ කරන ලෙසට ගරු බේරුම්කරණය විසින් නියම කලද, අද දින නඩුව ආරම්භ කිරීමට තමන් සූදානම්ව පැමිණ නොමැති බව දන්වා සිටින ලදුව බේරුම්කරණය විසින් තම නඩුව සඳහා සූදානම්වීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීමෙන් අනතුරුව පැමිණිල්ල විසින් සිය නඩුව ආරම්භ කරමින් සිය ඉල්ලුම්කාර සේවකයා වන වීරප්පුලිගේ ජයන්ත වීරසිරි මහතා සාක්ෂියට කැඳවන ලදී.

ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් පවසා සිටියේ තමන් වැටුප් රහිත නිවාඩු ලබා නොගත් බවයි. බේරුම්කරණයෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මෙම ඉල්ලුම්කාර සේවකයා පවසා සිටියේ තමන් වැටුප් රහිත නිවාඩු ලබා නොගත් බවයි. එහෙත් පළමු පාර්ශවය විසින් සලකුණු කරන ලද, ''ඒ 11'' දරන ලේඛනයෙන් දන්වා ඇත්තේ 2011, 2012 සහ 2013 වසරවලදී මෙම ඉල්ලුම්කාර සේවකයා විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු බව පැහැදිලි වේ.

දෙවන පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥ මහතා පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර සේවකයාගෙන් හරස් ප්‍රශ්න විමසමින් ඉල්ලුම්කරු විසින් කොන්දේසි සහිත ලිපියක් අත්සන්කොට භාර ගත්තාද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

''ඒ වාර්තා කළාට පස්සේ මහත්මයාට මොකුත් ලියවිල්ලක් ලැබුණේ නැද්ද සේවා කොන්දේසි අඩංගු?'' යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු විසින් පවසා ඇත්තේ ''ලැබුණේ නැත'' යන පිළිතුරයි. එහෙත් පසුව සාක්ෂිකරු විසින්ම එම සේවා කොන්දේසි අඩංගු පත්වීම් ලිපිය ලද බවට පිළිගෙන ඇත. තවද දෙවන පාර්ශවය විසින් හරස් ප්‍රශ්න විමසමින් අදාල කොන්දේසි සහිත පත්වීම් ලිපිය ''ආර් 1'' ලෙස සලකුණු කරමින් එහි පරිවාස කාලය අඩංගු කොටස ''ආර් 1 ඒ'' ලෙස සලකුණු කරමින් ප්‍රශ්න කරන ලදී. තවද, එම ලිපියේ 5 වෙනි කොන්දේසිය ''ආර් 1 සී'' වශයෙන් සලකුණු කරමින් ප්‍රශ්න කරන ලද අතර එම කොන්දේසියට අනුව මසක වැටුප තමන්ට ගෙවන ලෙසට සාක්ෂිකාර ඉල්ලුම්කරු විසින් විශ්ව විද්‍යාලයට යොමුකරන ලද ලිපිය ඔහු විසින් පිළිගත් අතර එම ලිපිය ''ආර් 2'' ලෙස සලකුණු කරන ලදී. තවද, එම ලිපියට අනුව තමන්ට මසක වැටුප ද ලැබුණු බව පිළිගන්නා ලදී. තවද සේවාසාන ප්‍රතිලාභ වන විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදල මුදා හරින ලෙසට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා වෙත යවන ලද ලිපිය සාක්ෂිකරු විසින් පිළිගන්නා ලද අතර එම ලිපිය ''ආර් 3'' ලෙසට සලකුණු කරන ලදී.

සාක්ෂිකරුගේ පරිවාස කාලය දීර්ඝ කිරීම පිළිබඳව ලිපිය සාක්ෂිකරු විසින් ''ඒ 8'' ලෙස ද දෙවන පාර්ශවය විසින් එය ''ආර් 5'' ලෙස ද සලකුණු කරමින් ප්‍රශ්න කිරීමේදී සාක්ෂිකරු විසින් තම මූලික සාක්ෂියේදී ඉදිරිපත් නොකරන ලද ලිපි ගැන කියමින් ප්‍රශ්න මග හැරීමට උත්සාහ ගත් බව ද නිරීක්ෂණය කළෙමි. සාක්ෂිකරු දිගින් දිගටම තමන් විසින් යවන ලද ලිපි 32 ක් ගැන ප්‍රකාශ කලද කිසිදු අවස්ථාවකදී තම මූලික සාක්ෂියේ දී එම ලිපි හෝ වෙනත් ආකාරයේ ලියකියවිලි කිසිවක් මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් නොකළ බවද මෙහිදී සැළකිල්ලට ගත්තෙමි. තවද මූලික සාක්ෂිය හරස් ප්‍රශ්නවලට භාජනය කරමින් 2011 සහ 2012 සාක්ෂිකාර සේවකයා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය විසින් ඔහු වෙත යොමු කරන ලිපි තමන් වෙත ලැබුණු බව සාක්ෂිකරු පිළිගෙන ඇත. මෙම සාක්ෂිය හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව පළමු පාර්ශවයේ නියෝජිත මහතා නැවත ප්‍රශ්න විමසීමක් කළ ද

කිසිඳු අවස්ථාවක දෙවන පාර්ශවයේ නීතිඥ මහතා විසින් ගෙන එන ලද කරුණු කිසිවක් අභියෝගයට ලක් නොකරන ලදී. තවද, පළමු පාර්ශවය විසින් වෙනත් සාක්ෂිකරුවකු ද කැඳවීමක් නොකරමින් තම නඩුව අවසන් කරන ලදී.

දෙවන පාර්ශවය වෙනුවෙන් තම නඩුව ආරම්භක කරමින් විශ්ව විද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී සංජීවනී දොඩන්තැන්න මහත්මිය සාක්ෂියට කැඳවන ලදී. මෙහිදී සාක්ෂිකාරිය මූලික සාක්ෂියට භාජනය කරමින් වෛද්‍ය හේතු මත මෙම ඉල්ලුම්කරු 2013 වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ නිවාඩුව අනුමත කර ඇති බවත් එම නිවාඩුව ඔහුට හිමි නිවාඩු 45 ට අතිරේකව ලබා දී ඇති බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. මෙහිදී මූලික සාක්ෂිවලින් ද නැවතත් මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර සේවකයා ලබා ගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳව ප්‍රශ්න කරන ලදුව පළමු පාර්ශවයේ සාක්ෂිකරුගෙන් අසන ලද හරස් ප්‍රශ්න මගින් දෙවන පාර්ශවය ගත් ස්ථාවරය තවදුරටත් තහවුරු කරන ලදී. දෙවන පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සහකාර ලේඛකාධිකාරීගේ මූලික සාක්ෂිය පළමු පාර්ශවයේ නියෝජිත මහතා විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කළ ද පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර සේවකයා විසින් විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදැයි පවසන ලද එහෙත් තම සාක්ෂියේ දී ඉදිරිපත් නොකරන ලද කිසිඳු ලේඛනයක් මෙම දෙවන පාර්ශවයේ සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදීවත් සලකුණු කර ඉදිරිපත් කිරීමට පළමු පාර්ශවය විසින් කටයුතු නොකිරීම මත පැහැදිලි වන්නේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර සාක්ෂිකරු විසින් අසත්‍ය තොරතුරු මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර ඇති බවයි. තව ද, දෙවන පාර්ශවයේ සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී කිසිඳු අවස්ථාවක මෙම සේවකයාගේ සේවය අවසන් කිරීම අසාධාරණ හා අයුක්ති සහගත බව හෝ වැටුප් රහිත නිවාඩු ලබා නොගත් බවට තහවුරු කිරීමට පළමු පාර්ශවය අපොහොසත් වී ඇත.

තව ද පළමු පාර්ශවයේ නියෝජිත විසින් සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පත්වීම් ලිපියෙහි සේවක නිවාඩු පිළිබඳ සඳහන් නොවීම පිළිබඳ විමසමින් දිගින් දිගටම  ප්‍රශ්න කරනු ලැබීය. එහිදී සාක්ෂිකාරිය කරුණු පැහැදිලි කරමින් නිවාඩු සම්බන්ධ ප්‍රතිපාදන විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ ඇති බවත්, තවත් විශාල චක්‍රලේඛ ප්‍රමාණයක් මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති බවත්, වරින් වර නිවාඩු පිළිබඳ වෙනස් වීම් සිදුවන බැවින් පත්වීම් ලිපියෙහි එය සඳහන් නොකරන ලද බවටත් සාක්ෂි ලබාදෙන ලදී. තවදුරටත් බේරුම්කරු විසින් විමසන ලද ප්‍රශ්නයකට පිළිතුරු සපයමින් සාක්ෂිකාරිය පවසා සිටියේ විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ ඇති ආකෘතියක් පදනම් කරගනිමින් පත්වීම් ලිපිය සකස් කරන බවත්, එම ආකෘතියෙහි නිවාඩු පිළිබඳ වෙනම දැක්වීමක් සිදුකර නොමැති බවත්ය. තවදුරටත් සාක්ෂි දෙමින් සාක්ෂිකාරිය පවසා සිටියේ විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ ඇමුණුම් ''4 - සී'' දරන ආකෘතිය මගින් පත්වීම් ලිපි ලබාදෙන බවත් එම ආකෘතියෙන් පරිබාහිරව පත්වීම් ලිපි නිකුත් කිරීමට විශ්ව විද්‍යාලයට හැකියාවක් නොමැති බවත්ය.

ඉන්පසුව 2010.01.21 දින දෙවන පාර්ශවය වෙනුවෙන් කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍ය අධිකාරී සාක්ෂියට කැඳවන ලදුව මූලික සාක්ෂි ලබා ගන්නා ලදී. සාක්ෂිකාරිය විසින් මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුට අදාළ 2012, 2013 හා 2014 වැටුප් වාර්තා ''ආර්'' ලේඛන ලෙස සලකුණු කරමින් මෙම ඉල්ලුම්කාර සේවකයාගේ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් වැටුපෙන් සිදුකරන ලද අඩුකිරීම් සම්බන්ධයෙන් සාක්ෂි ලබාදෙන ලදී. මෙහිදී සාක්ෂිකාරිය තවදුරටත් සාක්ෂි දෙමින් 2011 වර්ෂයට අදාළ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් වැටුප් අඩුකර ඇත්තේ 2012 මාර්තු සහ අප්‍රේල් මාසවල දී බවට වාර්තා ඉදිරිපත් කරන ලදී. තව ද වැටුප් රහිත නිවාඩුවලින් නිවාඩු දින දෙකක මුදල් අඩු කරගනු ලැබ ඇත්තේ මෙම ඉල්ලුම්කරුට අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමේ දී එම විශ්ව විද්‍යාලීය අර්ථසාධක අරමුදලෙන් බවට ලේඛන පෙන්වා සිටි අතර එම ලේඛන ''ආර්'' ලේඛන ලෙස දෙවන පාර්ශවය විසින් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

ඉන්පසු මෙම දෙවන පාර්ශවයේ සාක්ෂිකාරිය විසින් ලබාදෙන ලද මූලික සාක්ෂිය පළමු පාර්ශවයේ නියෝජිත තැන විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදී. හරස් ප්‍රශ්න විමසීමේදී පළමු පාර්ශවය, දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලැබූ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් සිදුකරන ලද අඩු කිරීම් සම්බන්ධයෙන් කිසිඳු ආකාරයකින් ඒවා වැරදි බවට හෝ වැරදි ලෙස සිදුකරන ලද වැටුප් අඩු කිරීම් බවට තහවුරු කිරීමට පළමු පාර්ශවය අපොහොසත් වී ඇත. එමෙන්ම එම වැටුප් රහිත නිවාඩු සම්බන්ධ මුදල් සේවකයාගේ වැටුපෙන් අඩුකිරීම අයුක්ති සහගත හෝ අසාධාරණ බවට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ අතර, එම අඩුකිරීම් ද්වේශ සහගතව පළිගැනීමේ චේතනාවෙන් කරන ලද අඩු කිරීම් බවට ද කරුණු සනාථ කිරීමට අපොහොසත්වී ඇත. දෙවන පාර්ශවය විසින් ''ආර් 1'' සිට ''ආර් 13'' දක්වා ලේඛන ලකුණු කරමින් සිය නඩුව අවසන් කරන ලද අතර, පළමු පාර්ශවය විසින් ''ඒ 1'' සිට ''ඒ 11'' දක්වා ලේඛන ලකුණු කරමින් සිය නඩුව අවසන් කරන ලදී. දෙපාර්ශවය විසින් සිය ලිඛිත දේශන 2020.02.25 දින විවෘත අධිකරණයේදී ඉදිරිපත් කරන ලදී.

පළමු පාර්ශවය තම පළමු ප්‍රකාශය මගින් දක්වා ඇත්තේ තමන් ලබාගන්නා ලද නිවාඩු සම්බන්ධයෙන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා වැටුප් අඩු කිරීම අසාධාරණ බවට විවිධ කරුණු ඉදිරිපත් කිරීමක් විනා තමාට අසාධාරණයක් විශ්ව විද්‍යාල පරිපාලනය මගින් සිදු වූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. තවද, සෑම වසරක් අවසානයේම මෙම ඉල්ලුම්කරු විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳව සේවකයා දැනුවත් කර ලිපි නිකුත් කර ඇති අතර එම ලිපි ''ආර්'' ලේඛන ලෙසට දෙවන පාර්ශවය විසින් සලකුණු කරමින් ඉදිරිපත් කර ඇති අතර, එසේ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් ලිපි ලැබුණු කිසිදු අවස්ථාවක මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරු කිසිදු විරෝධතාවයක් දක්වා නොමැති බවද සාක්ෂි මගින් තහවුරු කර ඇත. ඉන් අනතුරුව මෙම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීමෙන් පසුව වුවද, තම රැකියාව අසාධාරණ ලෙස අවසන් කළා යන්න දක්වමින් විශ්ව විද්‍යාලයෙන් කිසිදු ඉල්ලීමක් සිදුකර නොමැත. ඔහු විසින් තම පත්වීමේ ලිපියේ ඇති කොන්දේසි ප්‍රකාරව එනම් ''ඒ 6'' ලෙස ලකුණු කරන ලද ලේඛනයේ 5 වන ඡේදය යටතේ තමාගේ සේවය මසක කල් දීමකින් තොරව අවසන් කළ බැවින් මසක වැටුපක් ඉල්ලා විශ්ව විද්‍යාලය වෙත ලිපියක් ඉදිරිපත් කර

ඇති අතර එමගින් කිසිදු අවස්ථාවක නැවත රැකියාව අයැද සිට නොමැති බවද නඩු විභාගයේදී අනාවරණය විය. තම සේවාසන්න ප්‍රතිලාභ සියල්ලද කිසිදු විරෝධතාවයකින් තොරවම ලබාගෙන පසුව තම සේවය අසාධාරණ ලෙස අවසන් කළාය යන්න පවසමින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව මෙම ආරවුල බේරුම්කරණයෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත යොමුකර තිබුණි.

දෙවන පාර්ශවයේ ලිඛිත දේශන මගින් ඔවුන් දක්වා ඇත්තේ පරිවාස කාලය සම්බන්ධයෙන් ''ඒ 6'' ලේඛනයේ අඩංගු ප්‍රතිපාදන අනුව විශ්ව විද්‍යාලය කටයුතු කර ඇති බවත්, සේවකයා දිගින් දිගටම වැටුප් රහිත නිවාඩු ලබාගැනීම හා එසේ නිවාඩු ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමුකර එය නිවැරදිකර ගන්නා ලෙසට අවවාද කර තිබියදීත් එම තත්ත්වය ද නොසළකමින් වැටුප් රහිත නිවාඩු ලබාගැනීම හේතුකොට ගෙන ඔහුගේ සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්ති සහගත බවයි.

පළමු පාර්ශවය විසින් කිසිදු අවස්ථාවක මෙම සේවය අවසන් කිරීම දෙවන පාර්ශවය විසින් අසද්භාවයෙන් හෝ ද්වේශ සහගතව හෝ වෙනත් සැඟවුණු චේතනාවකින් යුතුව කටයුතු කරමින් සිදුකළ එකක් බව ඔප්පු කිරීමට උත්සාහයක්වත් ගෙන නොමැති බව ද මෙහිදී අවධානය යොමුකරන ලදී. තවද, දෙවන පාර්ශවය විසින් මෙම ඉල්ලුම්කරුගේ පැමිණීම යහපත් කර ගැනීම උදෙසා අවස්ථාවක් ලබාදී ඇති අතර, වසරක පරිවාස කාලය දීර්ඝ කිරීමක් ද කරමින් මෙම ඉල්ලුම්කරු තනතුරෙහි රඳවා ගැනීමට උත්සාහයක් දරා ඇති බව ද නිරීක්ෂණය වේ.

තවදුරටත් දෙවන පාර්ශවය විසින් සිය ලිඛිත දේශන මගින් ඉදිරිපත් කර ඇති නඩු තීන්දු දෙක කෙරෙහි ද අවධානය යොමු කළෙමි. එහිදී පහත සඳහන් නඩු තීන්දු දෙක කෙරෙහි ද අවධානය යොමු කළෙමි. එනම් -

01. State Distilleries Corporation *Vs.* Jackson Rupasinghe (1994) 2 SLR 395
02. Moosajees *Vs.* Rasiah, (1986) 1 SLR 365

යන නඩු තීරණ නිරීක්ෂණය කිරීමේදී පැහැදිලිවම පෙනී යන්නේ පරිවාස කාලය තුල සේවකයාගේ වැඩ පිළිබඳ සෑහීමකට පත්වීමට නොහැකි නම් එම් සේවකයාගේ සේවය කිසිඳු හේතුවක් නොදක්වා අවසන් කිරීමේ පරම අයිතිය සේවා යෝජක සතුවන බවයි. තවද පරිවාස කාලය තුල සේවකයකුගේ සේවය පිළිබඳව විනිශ්චය කළ හැකි එකම විනිශ්චය කළ හැකි එකම විනිශ්චයකරු සේවා යෝජක බවද පැහැදිලිවම දක්වා ඇත.

සමස්ත නඩු විභාගය පුරාවටම සේවා යෝජක විශ්ව විද්‍යාලය තම සේවය අසද්භාවයෙන් හෝ ද්වේශ සහගතව හෝ යම් සැඟවුණු චේතනාවක් පදනම් කර ගනිමින් අවසන් කළාය යන්න තහවුරු කිරීමට පළමු පාර්ශවය අපොහොසත්වී ඇත. එමෙන්ම පළමු පාර්ශ්වය විසින් වෙනත් කරුණු දක්වමින් මෙම සේවය අවසන් කිරීම අසාධාරණ බව කියාපෑමට උත්සාහ කළත් එය සාර්ථක වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද විශ්ව විද්‍යාලය සෑම විටම අදල ආයතන සංග්‍රහය සහ වෙනත් චක්‍රලේඛ සහ උපදෙස් අනුව කටයුතු කරමින් මෙම සේවකයාට තම පැමිණීම නිවැරදි කර ගැනීම සඳහා සාධාරණ කාලයක් ලබාදීමෙන් පසුවද එසේ පැමිණීම නිවැරදි කර ගැනීමට කිසිඳු උත්සාහයක් ඉල්ලුම්කරු විසින් නොගැනීම හේතුකොටගෙන නීත්‍යානුකූලව මෙම ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර ඇති බව තීරණය කරමි.

## ප්‍රදානය

පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගේ සේවය පරිවාස කාලය තුළ අවසන් කිරීම නියමිත පරිපාටියට යමින් එනම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයට අනුව නීත්‍යානුකූලව සිදුකර ඇති බවට තීරණය කරමි. මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගේ සේවය අවසන් කිරීම අසද්භාවයෙන් හෝ ද්වේශ සහගතව සිදුකල දෙයක් නොවන බවද, සේවකයකු පරිවාස කාලයකට යටත් කරනු ලබන්නේ ඔහු රැකියාව සඳහා සුදුසුද යන්න පරීක්ෂා කිරීම සඳහා වන බැවින් එසේ රැකියාවට නුසුදුසු පුද්ගලයකු තවදුරටත් සේවයෙහි තබාගැනීම ආයතනයට යහපත් නොවන බවද සැලකිල්ලට ගනිමින් මෙම ඉල්ලුම්කරුගේ සේවය පරිවාස කාලය තුලදී අවසන් කිරීම යුක්ති සහගත සහ සාධාරණ බව තීරණය කරමි. එබැවින් මෙම ආරවුල සම්බන්ධයෙන් කිසිදු ප්‍රදානයක් නොකරමි.

මෙම ප්‍රදානය යුක්ති සහගත සහ සාධාරණ තීරණයක් බවට තීරණය කරමි.

ඔබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2020 මාර්තු මස 11 වැනි දින.

08 – 612

මගේ අංකය: CI/609.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 02, යුනියන් පෙදෙස, අංක 424 හි පිහිටි කාමාට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 03, 22 වන පටුමග, අංක 03 හි පිහිටි ලංකා වෙළෙඳ, කාර්මික හා පොදු සේවක සංගමය අතර 2001.11.19 දින ඇතිකර ගන්නා ලදුව, අංක 1224/32 හා 2002.02.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2001 අංක 58 දරන සාමූහික ගිවිසුම අවලංගු කරන ලෙසට කාමාට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි මානව සම්පත් ප්‍රධානී විසින් කාර්මික ආරාවුල් පනතේ 9(2) ආ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නිවේදනයක් මා වෙත එවා ඇත.

131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 9(2) ආ වගන්තිය ප්‍රකාරව 2001 අංක 58 දරන සාමූහික ගිවිසුම ක්‍රියාත්මකවීම 2020 අගෝස්තු මස 31 දින සිට අවසන් වන බවට තවදුරටත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 අගෝස්තු මස 01 වැනි දින.
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

2020.07.15

කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මහතා,
කම්කරු කොමසාරිස් - කාර්මික සම්බන්ධතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මහත්මයාණෙනි,

පළමුවන උපලේඛනය
'අ' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත සාමූහික ගිවිසුමක් / බේරුම්කරුවකුගේ කම්කරු විනිශ්චය අධිකාරයක නිරවුල් කිරීමක් තීරණයක් / ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

2002.02.21 දින අංක 1224/32 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ද කාමාට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ලංකා වෙළෙඳ, කාර්මික හා පොදු සේවක සංගමය බැඳී සිටින්නා වූ ද 2001 අංක 58 දරන සාමූහික ගිවිසුම ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්තුතියි,
මෙයට,

මානව සම්පත් ප්‍රධානී,
කාමාට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

*පිටපත* - සභාපති,
ලංකා වෙළෙඳ, කාර්මික හා පොදු සේවක සංගමය

08 – 614

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.